**<u>මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව</u>**

**<u>පුරප්පාඩු</u>**

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. <u>තාක්ෂණික නිලධාරි (II) ශ්‍රේණිය"අ" ඛණ්ඩය</u>**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | :(I) | ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකම්.<br>හෝ |
| | (II) | ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව.<br>හෝ |
| | (III) | අදාල විෂය ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමාවක්.<br>හෝ |
| | (IV) | අදාළ විෂය ක්ෂේත්‍රයට අදාලව වසර දෙකක පූර්ණ කාලීන ඩිප්ලෝමාවක් සමඟ අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබිය යුතුය. |
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| **වැටුප් ක්‍රමය | : | U-MT 1 (II) රු. 57,435-7 X 640 – 9 X 890- 69,925/- (මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවාගන්නා ක්‍රමය | : | ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි. |

වෛද්‍ය රසායනාගාර තාක්ෂණය/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (වෙබ් අඩවි සංවර්ධනය,පවත්වාගෙන යාම, දත්ත කළමනාකරණය සහ වැඩසටහන්කරණය ඇතුළුව)/ජීව විද්‍යාව, ජෛව වෛද්‍ය විද්‍යාව, ජෛව තාක්ෂණය, රසායන විද්‍යාව/ බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ශිල්පීය ක්‍රම, විද්‍යුත් හා විදුලි සංදේශ, රසායන හා ක්‍රියාවලි තාක්ෂණ ක්ෂේත්‍රයන්හි මනා දැනුමක් හා අත්දැකීමක් ඇති අයට ප්‍රමුඛතා දෙනු ලැබේ.

**02.<u>පරිපාලක (භූමි දර්ශක) III ශ්‍රේණිය</u>**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | (1) (a) (i) | අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සමත් වීම.<br>සහ |
| | (ii) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන වසර එකක (01) ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් තිබීම. |
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| **වැටුප් ක්‍රමය | : | U-MT 1 (III) - රු. 51,095-7 X 540; 10 X 640 - 60,575/- (මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවා ගන්නා ක්‍රමය | : | සම්මුඛ පරීක්ෂණයක් මගින් |

## 03.කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා පාලන)

අවශ්‍ය සුදුසුකම්

1. අ.පො.ස (සා.පෙළ) විභාගය පහත සඳහන් විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබීම.
    - (i) සිංහල භාෂාව / දෙමළ භාෂාව
    - (ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
    - (iii) ගණිතය

    සහ

2. අ.පො.ස (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**පහත සඳහන් සුදුසුකම් ඇති අය සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

a. පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

b. පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්දක් තිබීම.

**තනතුරට විශේෂ වූ සුදුසුකම්**

ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා පාලන) තනතුරට විශේෂ වූ සුදුසුකම් සපුරාලිය යුතුය.

ගබඩාකරණය පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්දක් සහ/හෝ අ.පො.ස (සා.පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය සමත්වීම හෝ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ගිණුම්කරණය විෂයය සමත්වීම.

සටහන :-

විශ්වවිද්‍යාල විසින් තීරණය කරනු ලබන පරිදි, තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුය.

**වැටුප් ක්‍රමය : U-MN 1 (III) - රු. 49,475 - 17 X 540 – 58,655 (මාසික)
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

බඳවාගන්නා ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මඟින්

ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය.

- සිංහල /දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම
- බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම
- (පරිගණක සාක්ෂරතාවය)
- අදාල විෂය ක්ෂේත්‍රය

වෙනත් සුදුසුකම් :

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ඇ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**04.** **<u>කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (පොත් තැබීම)</u>**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | | 1.අ.පො.ස (සා.පෙළ) විභාගය පහත සඳහන් විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබීම.<br>(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව<br>(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය<br>(iii) ගණිතය<br>සහ<br>2.අ.පො.ස (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)<br>**පහත සඳහන් සුදුසුකම් ඇති අය සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**<br>a. පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.<br>සහ<br>b. පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්දක් තිබීම.<br><u>තනතුරට විශේෂ වූ සුදුසුකම්</u><br>ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (පොත් තැබීම) තනතුරට විශේෂ වූ සුදුසුකම් සපුරාලිය යුතුය.<br>නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලයකින් / තාක්ෂණික විද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ ශිල්පය පිළිබඳ ජාතික සහතික පත්‍රය හෝ පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන ඒ හා සමාන සුදුසුකමක් තිබීම.<br>හෝ<br>අ.පො.ස (උ.පෙළ) විභාගය වාණිජ්‍ය විෂය ධාරාවෙන් සමත්වීම . |
| **වැටුප් ක්‍රමය | : | UMN 1 (III) - රු. 49,475 - 17 X 540 – 58,655 (මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවා ගන්නා ක්‍රමය | : | ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මඟින්<br>ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය.<br>▪ සිංහල /දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම<br>▪ බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම<br>▪ (පරිගණක සාක්ෂරතාවය)<br>▪ අදාල විෂය ක්ෂේත්‍රය |
| වෙනත් සුදුසුකම් | : | (අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.<br>(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.<br>(ඇ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. |

## 05. <u>පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය</u>

| | |
|---|---|
| අවශ්‍ය සුදුසුකම් | 01. අ.පො.ස (සා.පෙළ) විභාගය පහත සඳහන් විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබීම.<br>(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව<br>(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය<br>(iii) ගණිතය<br>සහ<br>02. අ.පො.ස (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)<br>පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03ක් එකවර සමත් වීම ප්‍රමාණවත් වේ.<br>සහ<br>***පහත සඳහන් සුදුසුකම් ඇති අය සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**<br>a. පිළිගත් ආයතනයක පුස්තකාල හා තොරතුරු විද්‍යාව සම්බන්ධ ශිෂ්‍යයකුවීම හෝ අර්ධ/සම්පූර්ණ සුදුසුකමක් ලබා තිබීම.<br>හා<br>b. පිළිගත් ආයතනයකින් ලබාගත්, මාස 06කට නොඅඩු පරිගණක යෙදුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම. |
| වයස : | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| **වැටුප් ක්‍රමය : | U-MN 1 (III) - රු. 49,475 - 17 X 540 – 58,655 (මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවාගන්නා ක්‍රමය : | ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින් |

## 06 .<u>පුස්තකාල සේවක (III ශ්‍රේණිය)/ ආරක්ෂක නියාමක (III ශ්‍රේණිය)</u>

| | | |
|---|---|---|
| 1) | සුදුසුකම් : | අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 6 ක් සමත් වී තිබිය යුතුය. |
| 2) | වයස : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| 3) | වෙනත් : | (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.<br>(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.<br>(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.<br>ආරක්ෂක නියාමක (III ශ්‍රේණිය) තනතුරට අයදුම්කරන්නන් විසින් මෑතකදී ලබා ගත් පොලිස් වාර්තාවක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය. |

4) **වැටුප් ක්‍රමය : U-PL1 (III) රු. 42,775 -16x450 -49,975 (මාසික) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 (i) අනුව අදාල උපදෙස් අනුව වැටුප් ගෙවනු ලැබේ.

5) බඳවා ගන්නා ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මගින්

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් 2026.03.20 දින හෝ ඊට පෙර මාර්ගගත පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය. මාර්ගගත පද්ධතිය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා, අයදුම්කරුවන් **https://uom.lk/vacancies** වෙබ් අඩවිය වෙත පිවිසිය යුතුය. මාර්ගගත අයදුම්පත් ක්‍රියාවලිය 2026.03.01 දින සිට විවෘත වන අතර 2026.03.20 දිනෙන් අවසන් වේ.

සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ එක් එක් තනතුරු සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත බාගත කර එම දෘඪ පිටපත (Hard Copies) තමා විසින් සහතික කරන ලද හා සියලු ඇමුණුම් සමඟ සහකාර ලේඛකාධිකාරි, ආයතන (අනධ්‍යයන) අංශය, මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.03.20 දින හෝ ඊට පෙර යොමු කළ යුතුය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් ඉහත පරිදි බාගත කරන තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති හෝ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ (Shortlist) අයිතිය මොරටුව විශ්වවිද්‍යාලය සතුය. අවශ්‍ය අයදුම්පත් මාර්ගගත ක්‍රමය මගින් යොමු කිරීමේදී තාක්ෂණික ගැටළු ඇතිවුවහොත් 011-2640511 දුරකථන අංකය අමතන්න.

ලේඛකාධිකාරි,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.
2026.02.27